විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10.   மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10.   Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. } විවැ/චක්‍රලේඛ/2011   දිනය / திகதி / Date } 2011-02-18

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 11/2009 (සංශෝධන 01)**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 11/ 2009 රජයේ විශ්‍රාම වැටුප බැංකු පද්ධතිය හරහා ක්‍රියාත්මක කිරීම (විශ්‍රාමිකයින් සඳහා තනි ගිණුම් පවත්වාගෙන යාම)**

මවිසින් නිකුත් කරන ලද ඉහත චක්‍රලේඛයෙහි අංක 1 යටතෙහි නව විශ්‍රාමිකයින් සඳහා තනි ගිණුමක් පවත්වාගෙන යාම අනිවාර්ය කිරීමත් ඒකාබද්ධ ගිණුම් (බද්ධ ගිණුම්) පවත්වා ගැනීම ක්‍රමක්‍රමයෙන් නැවැත්වීමත් නියම කොට තිබේ. ඒ අනුව,

1. නව විශ්‍රාම වැටුප් ලිපිගොනුවක් ලැබීමේදී ඒකපුද්ගල ගිණුම (තනි ගිණුමක්) පවත්වාගෙන යාම අනිවාර්ය කිරීම.

2. වයස්ගත විශ්‍රාමිකයන් වෙතොත් ඔවුන්හට වඩාත් පහසු වන පරිදි ඔවුන්ගේ විශ්‍රාම වැටුප තැපැල් කාර්යාල මඟින් ගෙවීමට සැලැස්වීම. තැපැල් කාර්යාල වෙත යාමට නොහැකි විශ්‍රාමිකයන් වෙතොත් මාසිකව ග්‍රාම නිලධාරී සහතිකය මත වෙනත් අයෙකුට ගෙවීමට කටයුතු කිරීම.

3. දායකයා හා කලත්‍රයා යන දෙදෙනාම රජයේ නිලධාරීන් හෝ විශ්‍රාමිකයන් වන අවස්ථාවන්හිදී එනම් විශේෂ අවස්ථාවලදී පමණක් බද්ධ ගිණුම් තවදුරටත් පවත්වාගෙන යාමට අවස්ථාව ලබා දීම.

පවතින බද්ධ ගිණුම් තනි ගිණුම් බවට පරිවර්තනය කිරීමේදී විශ්‍රාමිකයන් ඉදිරිපත් කරන ගැටළු සලකා තවදුරටත් එකී බද්ධ ගිණුම් පවත්වාගෙන යායුතුද යන්න පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරුන් සුදුසු පරිදි ක්‍රියාකළ යුතුය යනුවෙන් දක්වා ඇත.

මෙම නියමය දෝෂ සහගත පරිදි අර්ථකතනය කරමින් සෑම විශ්‍රාමිකයෙකුටම අනිවාර්යෙන්ම තනි ගිණුමක් පවත්වාගත යුතු බවට ඇතැම් ප්‍රාදේශීය ලේකම්වරුන් දන්වන බවට දිනපතා පැමිණිලි මා වෙත ලැබී තිබේ. කෙසේ වෙතත් පහත සඳහන් අවස්ථා වලදී තවදුරටත් බද්ධ ගිණුම් පවත්වාගෙනයාමේ ගැටළුදායක තත්වයක් පැන නොනගී.



| | Telephone | Fax | | Telephone | Fax | | Telephone |
|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk

1. දායකයා සහ භාර්යාව යන දෙදෙනාම විශ්‍රාමිකයින් වීම සහ දෙදෙනාම වෙනුවෙන් එක ගිණුමක් පවත්වා ගැනීම.
2. රජයේ සේවයේ නියුතු දරුවන් සමඟ බද්ධ ගිණුම් පවත්වාගෙන යාම.
3. ඉතා වයස්ගතවීම, අසනීපවීම වැනි හේතු මත වෙනත් අයකුගේ උපකාරය අත්‍යවශ්‍ය අවස්ථාවකදී බද්ධ ගිණුම් පවත්වා ගැනීම.
4. ප්‍රාදේශීය ලේකම් සෑහීමට පත්වන හේතු ඉදිරිපත් කළ විට බද්ධ ගිණුම් පවත්වාගෙන යාම.
5. එමෙන්ම තැපැල් කාර්යාල පහසුකම් ආසන්නයේ පවතින විට ගෙවීම් තැපැල් කාර්යාලයට මාරුකිරීමටද ක්‍රියාකළ හැකිය.

ඉහත සඳහන් උපදේශයන්ට අනුව ක්‍රියා කරන ලෙස කාරුණිකව දන්වමි.

කේ .ඒ .තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 01. ජනාධිපති ලේකම් - දැ.ගැ.ස.
02. අග්‍රාමාත්‍ය ලේකම් - දැ.ගැ.ස.
03. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය. - දැ.ගැ.ස.
04. ලේකම් - මුදල් අමාත්‍යාංශය - දැ.ගැ.ස.
05. විගණකාධිපති - දැ.ගැ.ස.